# පරීක්ෂක වාර්තාව

## අන්තර්මධ්‍ය විභාගය - ජනවාරි 2014

(56) ව්‍යාපාර නීතිය හා කළමනාකරණය

විෂයයේ

**කළමනාකරණය**

(Management)

---

### ප්‍රශ්න අංක 01 - ලකුණු 10

**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) සංවිධානයක සිටින, සංවිධාන කෙරෙහි උනන්දුවක් / ඇල්මක් දක්වන අභ්‍යන්තර පාර්ශව හා බාහිර පාර්ශව අතර වෙනස මෙම කොටසින් විමසා තිබුණි.

බොහෝ අයදුම්කරුවන් නිවැරදිව ලියා ලකුණු උපයා තිබුණි. ඇතැම් අයදුම්කරුවන් අභ්‍යන්තර ලෙස අභ්‍යන්තර ශක්තීන් හා දුර්වලතාද බාහිර ලෙස අවස්ථා හා තර්ජන දක්වා තිබුණි. මෙය ව්‍යාපාර පරිසරය යන මාතෘකාව වරදවා වටහා ගෙන පිළිතුරු ලිවීමකි.

(b) සංවිධානයක ප්‍රධාන මූලිකාංග තුනක් සඳහන් කිරීමට තිබුණි. එහෙත් අයදුම්කරුවන් බොහොමයක්

දැක්ම: නිශ්ඨාව, පරමාර්ථ ලෙසද,

මිනිසුන්: සම්පත්, සංවිධාන ව්‍යුහය ලෙසද,

වැරදි පිළිතුරු ලබා දී තිබුණි.

(c) ව්‍යාපාරික පරමාර්ථයක ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කිරීමට තිබුණි. බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු දී නොතිබුණි. එයට හේතු වුයේ ව්‍යාපාරික පරමාර්ථ යනු කුමක්දැයි නිවැරදිව හඳුනා නොගැනීමයි. ඒ හේතුවෙන් ව්‍යාපාරික පරමාර්ථයක ලක්ෂණ පැහැදිලිව දැක්වීමට නොහැකි වී තිබුණි.

### ප්‍රශ්න අංක 02 - ලකුණු 10

**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) "කළමනාකරණයේදී පද්ධති ප්‍රවේශය" යන්න පැහැදිලි කිරීමට තිබුණි. නිවැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබුණේ අයදුම්කරුවන් සුළු පිරිසකි. බොහෝ අයදුම්කරුවන් පහත දැක්වෙන වැරදි පිළිතුරු සපයා තිබුණි:

- කළමනාකරණය ගැන පමණක් විස්තර කිරීම.
- සැලසුම්කරණය, සංවිධානකරණය, නායකත්වය හා පාලනය ගැන විස්තර කිරීම.
- පරිගණක පද්ධති භාවිත කිරීම.

මේ සඳහා හේතු වී ඇත්තේ පද්ධති ප්‍රවේශය නිවැරදිව හඳුනාගෙන නොමැති වීමය.

(b) සංවිධානයක ප්‍රධාන ශ්‍රිතීය කළමනාකරණ විෂය පථ මොනවාද යන්න විමසා තිබුණි. පිළිතුර වශයෙන් අපේක්ෂා කරන ලද්දේ නිෂ්පාදන, අලෙවිකරණ, මූල්‍ය, මානව සම්පත්, පරිපාලන, මෙහෙයුම් සහ තොරතුරු පද්ධති යන ඉතා පහසු කරුණු 4 ක් ඉදිරිපත් කිරීමය.

බොහෝ අයදුම්කරුවන් සැලසුම්කරණය, සංවිධානය, නායකත්වය හා පාලනය යන කළමනාකරණයේ මූලිකාංග ලියා තිබුණි.

(c) විවිධ කළමනාකරණ කුසලතා, එක් එක් කළමනාකරණ මට්ටම සඳහා කෙසේ වෙනස් වන්නේදැයි විස්තර කිරීමට තිබුණි. බොහෝ අයදුම්කරුවන් කළමනාකරණ කුසලතා හඳුනාගෙන ඉදිරිපත් කොට අදාල ලකුණු උපයා තිබුණි. අයදුම්කරුවන් මෙම කුසලතා කළමනාකරණ මට්ටම් හා ගැලපීමේදී විවිධ ආකාරයේ කරුණු ඉදිරිපත් කර තිබුණි. අයදුම්කරුවන් මෙම කුසලතා කළමනාකරණ මට්ටම් හා ගැලපීම ගැන තවදුරටත් හැදෑරීම කළ යුතු වේ.

## ප්‍රශ්න අංක 03 - ලකුණු 10

**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) "සංවිධාන ව්‍යුහය" සහ "සංවිධාන සටහන" අතර වෙනස සඳහන් කිරීමට තිබුණි. බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු ලියා ලකුණු උපයා තිබුණි.

(b) සැලසුම්කරණය, කාර්යක්ෂමතාවය, සඵලත්වය සහ ඵලදායිතාවය අතර සම්බන්ධතාවය පැහැදිලි කිරීමට තිබුණි. බොහෝ අයදුම්කරුවන් පද හතර නිවැරදිව නිර්වචනය කර තිබුණත් ඒවායේ සම්බන්ධතාවය නිවැරදිව පැහැදිලිව කර නොතිබුණි.

(c) (i) "අධිකාරිය පැවරීම" යන්නෙන් කුමක් අදහස් කෙරේද යන්න ප්‍රශ්නයෙන් විමසා තිබුණි. පිළිතුර ලෙස අපේක්ෂා කරන ලද්දේ නිශ්චිත කාර්යයන් ඉටු කිරීම සඳහා වූ අධිකාරිය යටත් සේවකයෙකුට විතැන් කිරීමටත්, එහි වගකීම පැවරුම්ලාභියා වෙත නිර්මාණය කිරීමත් වේ.

අයදුම්කරුවන් මෙම පිළිතුර ලිවීමේදී අඩුපාඩුකම් දක්නට ලැබුණි. අධිකාරිය හා වගකීම යන පදවල අර්ථය වටහා ගැනීම පිළිබඳ දුර්වලතා තිබුණි.

(ii) අධිකාරිය පැවරීමේ වාසි 4 ක් සඳහන් කිරීමට තිබුණි. බොහෝ අයදුම්කරුවන් ඉතා සාර්ථකව මෙම ප්‍රශ්නයට පිළිතුරු ලියා ලකුණු ලබා ගැනීමට සමත් විය.

## ප්‍රශ්න අංක 04 - ලකුණු 10

**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) මානව සම්පත් වලට සුවිශේෂි වූ ලක්ෂණ 2 ක් ලැයිස්තුගත කරිමට තිබුණු අතර බොහෝ අයදුම්කරුවන් ඒවා පැහැදිලිව ලියා අදාල ලකුණු පහසුවෙන් ලබාගෙන තිබුණි.

(b) "රැකියා නිර්මාණය" සහ "රැකියා විශ්ලේෂණය" අතර වෙනස පැහැදිලි කිරීමේදී සමහර අයදුම්කරුවන්ට ප්‍රශ්නය ගැන පැහැදිලි අවබෝධයක් නොතිබීම නිසා ප්‍රශ්නයට කිසිසේත් අදාල නොවන කරුණු ලියා තිබණි.

බොහෝ අයදුම්කරුවන් රැකියා නිර්මාණය යනු රැකියා නැති අයට රැකියා සොයාදීම වැනි කරුණුද රැකියා විශ්ලේෂණය යනු වැඩ බෙදා දීම ලෙසද විස්තර කර තිබුණි. අයදුම්කරුවන් මේ පිළිබඳව අවබෝධය ලබා ගත යුතු වේ.

(c) සංවිධානමය පරමාර්ථ සහ අරමුණු ළඟා කර ගැනීම සඳහා සංවිධානයක කාර්ය සාධන ඇගයීම් පද්ධතිය භාවිත කළ හැක්කේ කෙසේදැයි පැහැදිලි කිරීමට තිබුණි.

බොහෝ අයදුම්කරුවන්ගේ කාර්ය සාධන ඇගයීම් පද්ධතිය ගැන දැනුම දුර්වල වූ නිසා ලියා තිබූ පිළිතුරු අසාර්ථක විය. එමෙන්ම සංවිධානමය පරමාර්ථ සහ අරමුණු ගැන පැහැදිලි අදහසක් නොතිබුණි. මෙම මාතෘකා ගැන අයදුම්කරුවන් පැහැදිලි අධ්‍යයනයක් කිරීම අත්‍යාවශ්‍ය බව පෙන්වා දිය යුතුය.

## ප්‍රශ්න අංක 05 - ලකුණු 10

**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) සුපිරි වෙළෙඳ සැලක පහළ මට්ටමේ සේවකයන් අභිප්‍රේරණය කිරීම සඳහා භාවිත කළ හැකි මූල්‍ය නොවන අභිප්‍රේරණයන් 2 ක් සඳහන් කිරීමට තිබුණි. මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු ලියා තිබුණි.

(b) සඵලදායී නායකත්වය කෙරෙහි බලපෑම් කළ හැකි අවස්ථානුකූල සාධක 3 ක් සඳහන් කිරීමට තිබුණි. පිළිතුර ලෙස පහත සඳහන් ඕනෑම කරුණු 3 ක් ලියා ලකුණු ලබා ගැනීමට හැකිව තිබුණි.

(1) සංවිධානයේ ගති ලක්ෂණ (උදා: සංස්කෘති ප්‍රතිපත්ති, ව්‍යුහය, ආදිය)

(2) නායකත්ව ගති ලක්ෂණ (උදා: අපේක්ෂා, පෞර්ෂත්වය, ආදිය)

(3) සාමාජිකයන්ගේ ඉහළ කළමනාකරුවන්ගේ, සම මට්ටමේ කළමනාකරුවන්ගේ සහ යටත් සේවකයන්ගේ ගති ලක්ෂණ (උදා: ඉහළ කළමනාකරුවන්ගේ නායකත්ව ශෛලිය, සේවකයන්ගේ දැනුම කුසලතා ආදිය)

(4) කාර්යයයේ ගති ලක්ෂණ (උදා: කාර්යයේ වැදගත්කම, කාර්ය ව්‍යුහය, ආදිය)

අපේක්ෂිත පිළිතුර එය වුවද අයදුම්කරුවන් කරුණු තේරුම් ගෙන නොතිබුණු අතර ඒ පිළිබඳව දැනුම ඉතාම අල්ප විය.

(c) මෙම ප්‍රශ්නයේදී කාර්ය නැඹුරු නායකත්ව ශෛලිය සහ සේවක නැඹුරු නායකත්ව ශෛලිය කෙටියෙන් පැහැදිලි කිරීමට තිබුණි. බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්නය හොඳින් තේරුම් ගෙන ලකුණු ලබා තිබුණි.

## ප්‍රශ්න අංක 06 - ලකුණු 10

**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) "මූල්‍ය" සහ "මූල්‍ය නොවන" පාලනයන් අතර වෙනස සඳහන් කිරීමට තිබුණි. බොහෝ අයදුම්කරුවන් මූල්‍ය පාලනය ගැන පමණක් නිවැරදි පිළිතුරු සපයා තිබුණ අතර මූල්‍ය නොවන පාලනය ගැන පිළිතුරු ඉතා දුර්වල මට්ටමක විය.

(b) කාර්යාල බිම් සැලසුම්වල වර්ග 2 ක් කෙටියෙන් පැහැදිලි කිරීමට තිබුණි. මෙම ප්‍රශ්නයටද අයදුම්කරුවන්ගේ දැනුම ඉතා පහළ මට්ටමක පැවතුණි.

(c) "නිෂ්පාදන සංකල්පය" සහ "අලෙවිකරණ සංකල්පය" අතර වෙනස විස්තර කිරීමට තිබුණි. අලෙවිකරණ සංකල්පය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම ඉතා අඩු මට්ටමක පැවතුණි.

\- - -

## <u>සැලකිය යුතු පොදු කරුණු:</u>

(1) සමස්ථයක් ලෙස ගත් කල පිළිතුරු සැපයීම සාර්ථක යැයි සැලකිය හැක. කළමනාකරණය ප්‍රශ්න පත්‍රය අයදුම්කරුවන්ට පිළිතුරු සැපයීමට අපහසු එකක් නොවූවත් ලකුණු දීමේදී අඩු ලකුණු ලබා ගැනීමට හේතු වී ඇත්තේ බොහෝවිට අසන ප්‍රශ්නයට නිවැරදි පිළිතුර නොව තමා දන්නා විෂය කරුණු සියල්ල ඉදිරිපත් කිරීම ය. බොහෝවිට විෂය කරුණු පිළිබඳව දැනුම තිබුණද පිළිතුරු ලිවීමේ අභ්‍යාස වල නොයෙදීම නිසා අයදුම්කරුවන්ට අඩු ලකුණු ලබා ගැනීමට සිදුවිය. එයට හේතු වන්නේ **බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රය අතට ගත්විට ප්‍රශ්නය හොඳින් කියවා තේරුම් නොගෙන අනවශ්‍ය දේ ලිවීමට පෙළඹෙන අතර වටිනා කාලයද අපතේ යවනු ඇත.**

(2) ප්‍රශ්න අංක යෙදීම, ප්‍රශ්නයේ කොටස් සඳහා වෙන වෙනම පිළිතුරු පැහැදිලිව ඉදිරිපත් කිරීම, පිළිතුරු පොතේ මුල් පිටුවේ ඇති **"අයදුම්කරුවන්ට උපදෙස්"** හොඳින් කියවා පිළිපැදීම යන කරුණු වැදගත් බව සලකන්න.

(3) තවද විභාගයට පෙර පසුගිය ප්‍රශ්න පත්‍රවලට නිශ්චිත කාලයක් තුල පිළිතුරු සපයා පෙර පුහුණුවක් ලබා ගැනීම ඉතා වැදගත්ය.

(4) ඒඒටී ආයතනයෙන් නිකුත් කර ඇති <u>ස්වඅධ්‍යයන පාඩම් මාලාව</u> පොත පරිශීලනය කිරීම ඉතා වැදගත් බව සඳහන් කළ හැක.

- * * * -